**පොල් පර්යේෂණ මණ්ඩලය - 2021**

**----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**---------------------------**

පොල් පර්යේෂණ මණ්ඩලයේ 2021 දෙසැම්බර්31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**--------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වා ගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරනපාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිතහාසාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නිතීරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 හි 44 ඡේදය ප්‍රකාරව අනාගත කාලපරිච්ඡේදයට බලපෑමක් ඇති වේ යැයි අපේක්ෂා කළ හැකි සිද්ධියක බලපෑම හා එහි අගය මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී විකුණූ පොල් වෙනුවෙන් ගැණුම්කරුවෙකුගෙන් අයවිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු.6,334,159 ක මුදල ගෙවීම පැහැර හැර වංචා කිරීම සම්බන්ධව වංචා විමර්ශන කාර්යාංශයට පැමිණිලි කර ඇති නමුත් මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කිරීමක් සිදු කර නොතිබුණි. | 2022 වර්ෂයේ සිට මෙවැනි අනාගත කාලපරිච්ඡේදයට බලපෑමක් ඇති වේ යැයි අපේක්ෂා කළ හැකි සිද්ධීන්වල බලපෑම හා එහි අගයන් මූල්‍ය ප්‍රකාශන තුළින් හෙළිදරව් කිරීමට කටයුතු සිදු කරන බව දන්වමි. | අනාගත කාලපරිච්ඡේදයට බලපෑමක් ඇති වේ යැයි අපේක්ෂා කළ හැකි මෙම ගනුදෙනුවේ බලපෑම හා එහි අගය මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 11 හි 44 හා 45 ඡේදවල සඳහන් වන ආකාරයට ආයතනයට ලැබෙන ව්‍යාපෘති ප්‍රදානවලින් මිලදී ගන්නා වත්කම් ක්‍රමක්ෂ්‍ය කිරීමට කටයුතු කර නොතිබුණි. මේ නිසා මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු.130,657,057 ක ප්‍රදානවල අගය නිවැරදිව නිරූපනය නොවන බවට නිරීක්ෂණය විය. | වර්ෂ ගණනාවකට පෙර මිළ දී ගෙන ඇති වත්කම් එක් එක් ව්‍යාපෘතිය අනුව හඳුනාගැනීමේ අසීරුව හා අවසන් වී ඇති ව්‍යාපෘතිවල ඇතැම් වත්කම් තවමත් ක්ෂය කිරීම යන ගැටළු මේ සඳහා බලපා ඇති නමුත් 2022 වර්ෂයේ සිට මෙම ගැලපුම සිදු කිරීමට කටයුතු කරන බව දන්වමි. | ව්‍යාපෘති ප්‍රදානවලින් මිලදී ගන්නා වත්කම් ක්‍රමක්ෂ්‍ය කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 20 හි 17 වන ඡේදය ප්‍රකාරව විද්‍යාත්මක හෝ තාක්ෂණ දැණුම, ප්‍රචාරන පට ආදී වීඩියෝ පට අස්පෘශ්‍ය වත්කම් වශයෙන් හඳුනාගත යුතු අතර ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරාවට ලියාහැරීම කළ යුතුය. එසේ වුවද, දීර්ඝ කාලීන දේශීය හා විදේශීය තාක්ෂණ ප්‍රවර්ධනය අරමුණු කර ගනිමින් රූපවාහිණියේ, ගුවන් විදුලියේ හා සමාජ මාධ්‍ය ජාලාවන්හි ප්‍රචාරය කරන ලද පොල් භාවිතය සම්බන්ධ වීඩියෝ වැඩසටහන් සඳහා දරන ලද රු.5,775,000 ක් සමාලෝචිත වර්ෂයේ පර්යේෂණ වියදම් වශයෙන් ලියාහැර තිබුණි. මෙම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා අස්පෘශ්‍ය වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවලින් දැක්වුණි. | අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂාවෙන් නොවමහජනතාව දැනුවත් කිරීමේ අපේක්ෂාවෙන් කරන ලද පර්යේෂණ අවධියේ දී පැන නැගි වියදම් වන බැවින් අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනාගෙන නැත. | විද්‍යාත්මක හෝ තාක්ෂණ දැණුම, ප්‍රචාරන පට ආදී වීඩියෝ පට අස්පෘශ්‍ය වත්කම් වශයෙන් හඳුනාගත යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මණ්ඩලය විසින් වතුවල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා දරනු ලබන පිරිවැය ජංගම නොවන වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේදී එම වත්කම් සඳහා සිදු කර තිබුණු රු.13,229,854 ක ගැලපීම් සම්බන්ධයෙන් විස්තර විගණනයට ඉදිරිපත් නොවීම නිසා මෙම වත්කම්වල නිවැරදිතාවය පිළිබඳව විගණනයේදී තහවුරු කරගත නොහැකි විය. | ආයතනයේ සියලුම පර්යේෂණ හා ජාන සම්පත් මධ්‍යස්ථානවල පැල වගාවෙහි වැඩිදියුණු කිරීම් සඳහා දරනු ලබන වියදම් වතු වැඩිදියුණු කිරීම් ගිණුම්වලින් පෙන්නුම් කරන අතර වියදම කුමක්ද යන්න හඳුනාගැනීමේ අවශ්‍යතාවයක් පැන නොනැගුණි. | වතුවල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම් සම්බන්ධ ගැලපීම් මොනවාද යන්න පැහැදිළි කළ යුතුය. |
| (ආ) 2021 මැයි 13 දින සිට දෙසැම්බර් 23 දින දක්වා කාලය තුළ පැවැත්වූ වෙන්දේසි 51 කදී වෙන්දේසි කළ පොල් ගෙඩි 762,522 ක් සඳහා ඉන්වොයිස් නිකුත් කර නොතිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේමූල්‍ය ප්‍රකාශන වල තොගය වැඩියෙන් ද, රු.45,788,857 ක් බැහින් විකුණුම් ආදායම හා ණයගැතියෝ අඩුවෙන් ද දැක්වුණි. | 2021 මැයි 13 දින සිට 2021 දෙසැම්බර් 23 දින දක්වා කාලය තුළදී අලෙවි කරන ලද සියලුම පොල් සඳහා වන වටිනාකමට අදාළව ඉන්වොයිස්පත් 2022 ජනවාරි මාසය තුළදී නිකුත් කර අවසන් කරන ලදි. | පොල් වෙන්දේසි කළ වහාම ඉන්වොයිස් නිකුත් කළ යුතුය. |
| (ඇ) මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී පෙර වර්ෂ ගැලපීම්, ජීව විද්‍යාත්මක වත්කම් සහ ජංගම වත්කම් හා වගකීම් අයිතමයන් නිවැරදි නොවන ආකාරයට ගලපා තිබීම නිසා මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණු ශුද්ධ මුදල් ප්‍රවාහය | නිවැරදි කිරීමට කටයුතු කරමි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව සකස් කළ යුතුය. |

රු.102,986,393 ක් වැඩියෙන් ද, මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණු වත්කම් සඳහා සිදු කර තිබුණු ගැලපීම් නිවැරදිව ගලපා නොතිබීම නිසා මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.154,071,712 ක් අඩුවෙන් ද දැක්වුණි.

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානයට රු.30,454,286 ක් වූ ණයගැති ශේෂය තුළ වසර 5 කට වැඩි කාලයක් තිස්සේ හිඟහිටව පවතින රු.433,487 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | අයකර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු. රෙ.143(3)(අ) | ලැබෙන සියලුම මුදල් නිතිපතා බැංකුවේ තැන්පත් කළ යුතු වුවත් පල්ලම ජාන සම්පත් මධ්‍යස්ථානයේ 2021 වර්ෂයේ රැස් කළ රු.12,052,646 ක් දින 07 ත් දින 42 ත් අතර කාලයක් ප්‍රමාද කර බැංකු ගත කර තිබුණි. | රටතුළ පැවති කොවිඩ් තත්ත්වය හේතුවෙන් ලැබෙන විවිධ ආදායම් මුදල් බැංකු ගත කිරීම ප්‍රමාදවීම් සිදුවිය. | ලැබෙන සියලුම මුදල් නිතිපතා බැංකුවේ තැන්පත් කළ යුතුය. |

# 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.151,245,792ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තයරු.19,639,622 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.131,606,170ක වර්ධනයක් නිරීක්ෂණය විය. පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම රු.43,427,570 කින් ඉහළ ගොස් වියදම රු.88,178,600 කින් පහළ යාම මෙම වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවනතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත ආදායම රු.558,504,483 ක් වුවද, ඊට වඩා රු.92,279,127 ක් හෙවත් සියයට 16 ක් වැඩියෙන් රු.650,783,610 ක ආදායමක් උපයා තිබුණි.ඇස්තමේන්තු ගත හා තත්‍ය වියදම් අතර සැසදීමේදී වියදම් ශීර්ෂ 02 ක ඇස්තමේන්තු ගත වියදමට වඩා පිළිවෙලින් සියයට 18 ක් හා සියයට 33 ක් අඩුවෙන් ද, එක් වියදම් ශීර්ෂයක ඇස්තමේන්තුගත වියදමට වඩා සියයට 93 ක් වැඩියෙන් ද වැය කර තිබුණි. ඒ අනුව අයවැය ලේඛනය සඵල කළමණාකරන පාලන කාරකයක් ලෙස යොදාගෙන නොමැති බවට නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේ මැයි, ජුනි හා ජූලි මාසයන්හි අවස්ථා 04 කදී කොළඹ ප්‍රදේශයේ පෞද්ගලික සමාගමකට වෙන්දේසි කළ නමුත් මුදල් ගෙවා රැගෙන යාමට කටයුතු නොකළ රු.4,484,947 ක් වටිනා පොල් ගෙඩි 72,623 ක් 2022 පෙබරවාරි 10 දින දක්වා මාස 06 ත් මාස 09 ත් අතර කාලයක් රඳවාගෙන ඒවා පැළ වූ පසුව රු.3,011,053 කට නැවත අලෙවි කර තිබීමෙන් මණ්ඩලයට රු.1,473,894ක පාඩුවක් සිදු වී තිබුණි. | රට තුළ පැවති COVID-19 වසංගත තත්වය හමුවේ නිරෝධායන ඇඳිරි නීතිය හේතුවෙන් පොල් ගැණුම්කරුවන් පොල් ඉවත් කර ගැනීම ප්‍රමාද විය. | පොල් අලෙවි කිරීම සම්බන්ධ අභ්‍යන්තර පාලනය වැඩිදියුණු කිරීමටත්, වගකීම් ඉටු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මණ්ඩලය සතු පොල් වතුවල පොල් අස්වැන්න ලබා ගැනීම සම්බන්ධයෙන් චක්‍රලේඛ නිකුත් කර තිබුණ ද, වැටෙන පොල් ප්‍රතිශතය අවම කිරීම, වාර්ෂිකව කැඩිය යුතු පොල් මුර ප්‍රමාණය, කලටි පොල්, පුහු පොල් හා නරක් වූ පොල් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව ප්‍රමාණවත් උපදෙස් ලබා දී නොතිබුණි. මෙම නිසා මණ්ඩලයේ පොල් අස්වැන්න වාසිදායකව හා සාර්ථකව කළමණාකරනය කර ඇති බවට නිරීක්ෂණය කළ නොහැකි විය. | පොල් පර්යේෂණ ආයතනයේ වතු තුළ නිවැරදි ක්‍රමවේදයන්ට අනුව කටයුතු සිදුකර ඇත. සාමාන්‍යයෙන් නිවැරදිව නඩත්තු වන වාණිජ මට්ටමේ පොල් වගාවක වැටුනු පොල් ප්‍රතිශතය සියයට 20 කට ආසන්න අගයක් වේ. | චක්‍රලේඛ මඟින් නිසි උපදෙස් ලබාදී වාසිදායකව පොල් අස්වැන්න ලබා ගනිමින් අස්වැන්න සාර්ථකව කළමණාකරනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) වර්ෂ 1992 – 2004 දක්වා කාල පරාශය තුළ ශිෂ්‍යත්ව ලබා විදේශගතව නැවත සේවයට නොපැමිණි නිලධාරින් 08 දෙනෙකුගෙන් ගිවිසුම් ප්‍රකාරව මණ්ඩලයට අයවිය යුතු රු.27,529,683 ක මුදලක් නිලධාරින්ගෙන් සහ ඇපකරුවන්ගෙන් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබුණි. | අදහස් දක්වා නොමැත. | නිලධාරින්ගෙන් සහ ඇපකරුවන්ගෙන් මුදල් අයකර ගැනීම සඳහා නීතිමය කටයුතු කළ යුතුය. |
| (ඇ) 2019 වර්ෂයේ සිදුකළ ගුවන් ටිකට්පත් මිලදී ගැනීම් රු.68,500 ක් හා නිලධාරීන් දෙදෙනෙකුට ලබාදී ඇති විදේශ ගමන් අත්තිකාරම් රු.322,073ක් පියවා නොතිබුණි. | ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී නොතිබූ බැවින්, මෙම අත්තිකාරම් පියවීම ප්‍රමාද වී තිබුණි. | නොපමාව මෙම මුදල් පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ)තෙවන පාර්ශවයන් විසින් මණ්ඩලයට විරුද්ධව සේවා ප්‍රශ්න හා මූලික අයිතිවාසිකම් කඩ කිරීම සම්බන්ධයෙන් නඩු 04 ක් ගොනුකර තව දුරටත් නොවිසඳී ඉදිරියට ගෙන එමින් තිබුණි. | විභාග වෙමින් පවතී. | නඩු කටයුතු කඩිනමින් අවසන් කර ගැනීමට කටයුතු කළ යුතුය. නඩු ඇති නොවන ආකාරයට සේවක කළමණාකරනය කළ යුතුය. |
| (ඉ) අඹකැලේ වත්තේ වසර ගණනාවක සිට භාවිතා කළ නොහැකි තත්ත්වයට පත් වී ඇති නිල නිවාස 07 ක් හා සංචාරක නිවාසයක් ද, බැම්ම කැඩී යාමෙන් නිසි ජල ධාරිතාවක් පවත්වා ගත නොහැකි වූ වැවක් ද ප්‍රතිසංස්කරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි. | නිල නිවාස හා සංචාරක නිවාසය අළුත්වැඩියා කර ඇත.වැව් බැම්ම ප්‍රතිසංස්කරණය සඳහා අවශ්‍ය වන මුදල් වෙන්කර ප්‍රමාණපත්‍ර (BOQ) සකස් කරඇති අතර ඉදිරියේදි ටෙන්ඩර් මිල ගණන් කැඳවා කාර්යය ඉටු කිරීමට නියමිතය. | මණ්ඩලය සතු මෙම වත්කම් අවශ්‍ය පරිදි අලුත්වැඩියා හා නඩත්තු කටයුතු සිදු කර ඵලදායී ලෙස භාවිතයට ගත යුතුය. |

**3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

-------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මණ්ඩලය විසින් 2021 මැයි හා ජුනි මාසයන්හි සමාගම් 02 කට විකුණා තිබුණු පොල් ගෙඩි 96,816 ක් සඳහා ලබාගත් රු.6,334,159 ක චෙක්පත් 07 ක් අගරු වී තිබුණු අතර චෙක්පත් නිශ්කාෂණය වීමට පෙර පොල් තොග ඉවත් කරගෙන යාමට ඉඩ ලබා දී තිබුණි. මේ අතරින් පොල් ගෙඩි 86,816 ක් රු.5,627,159 කට විකුණූ සමාගමේ චෙක්පත් දිගින් දිගටම අගරු වෙමින් | අගරු චෙක්පත් සඳහා අවස්ථා කිහිපයකදීම චෙක්පත් ලබා දුන්නද ඒවාද අගරු විය. මේ සඳහා කොළඹ වංචා විමර්ශන කාර්යංශයේ පැමිණිල්ලක් දමා ඇත.පොල් අලෙවියෙන් ලද චෙක්පත් සඳහා රිසිට් පත් අනුව පොල් ඉවත් කර ගැනීමට බලය පැවරීමේ නිවේදනයන් නිකුත් කරන ලදි. | පොල් අලෙවි කිරීම සම්බන්ධ අභ්‍යන්තර පාලනයේ පවතින අඩුපාඩු නිවැරදි කර ගැනීමටත්, අයවිය යුතු මුදල් අයකර ගැනීම පිණිස නීතිමය කටයුතු නිසි පරිදි මෙහෙය වීමටත්, වගකිව යුතු නිලධාරීන් |

| | | |
|---|---|---|
| තිබිය දී ඒ පිළිබඳව නොසලකා තවත් රු.12,659,704 ක් වටිනා පොල් ගෙඩි 218,335 ක් එම සමාගමට ලබාදී වර්ෂය අවසානය තෙක්ම ඉන්වොයිස් නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණු අතර මෙම පොල් තොග ඇතුලුව වෙන්දේසි 51 කදී අලෙවි කළ පොල් ගෙඩි 762,522 ක් සඳහා අයවිය යුතු රු.45,788,857 ක් සඳහා පොල් සංවර්ධන අධිකාරියේ පොල් වෙන්දේසි නීති මාලාව ප්‍රකාරව ප්‍රමාද ගාස්තු සහ දඩ ගිණුම්ගත කර අය කර ගැනීමට ද කටයුතු කර නොතිබුණි. මෙම මතභේදාත්මක ගනුදෙනු කෙරෙහි කළමණාකාරිත්වයේ නිසි අවධානය යොමු වී ඇති බවට නිරීක්ෂණය නොවීය. | | සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) මණ්ඩලයට අයත් අඹකැලේ ජාන සම්පත් මධ්‍යස්ථානයේ කිරි ලබාගත හැකි එළදෙනුන් 21ක් සිටින නමුත් 2018මාර්තු 16දිනෙන් පසුව කිරි අලෙවි ආදායමක් වාර්තා කර නොතිබීම මතභේදාත්මක කරුණක් විය. තවද, අක්කර 318.5 ක විශාලත්වයකින් යුතු මෙම මධ්‍යස්ථානයේ ක්ෂේත්‍ර සහ පරිපාලන කටයුතු සහකාර වතු අධිකාරීවරයකු විසින් ද, සියලුම කාර්යාල කටයුතු වෙක්රෝල් පදනමින් සිටින කම්කරු සේවිකාවක් විසින් ද සිදු කිරීම හේතුවෙන් පරිපාලන කටයුතු නිසියාකාරව සිදු නොවන බවට නිරීක්ෂණයවිය. | එළදෙනුන් 21 දෙනෙකු සිටිය ද, 2018 වර්ෂයේ සිට කිරි ලබා ගැනීම සඳහා කම්කරුවෙකු නොමැති වීමෙන් කිරි අලෙවි අදායමක් වාර්තා වී නොමැත. ඉදිරියේදී නව කම්කරුවෙකු බඳවාගෙන කිරි දෙවීම් කටයුතු සිදු කිරීමට නියමිතය.<br>වත්ත තුළ කාලයක් තිස්සේ පවතින ලිපිකරු පුරප්පාඩුව සඳහා නිලධාරියෙකු යෙදවීමට නියමිතය. | මණ්ඩලය සතු මෙම සම්පත් ප්‍රශස්ත ලෙස උපයෝජන කළ යුතුය. කිරි ආදායම් ගිණුම්ගත නොවීම පිළිබඳ පරීක්ෂණයක් සිදු කළ යුතුය. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අඹකැලේ ජාන සම්පත් මධ්‍යස්ථානයේ අක්කර 75 ක භූමි ප්‍රමාණය තුළ පොල් ගස් 4015 කට හා පල්ලම ජාන සම්පත් මධ්‍යස්ථානයේ අක්කර 200 ක භූමි ප්‍රමාණය තුළ පොල් පැළ 8000 කට ජලය සැපයීම සඳහා රු.26,425,215 ක වියදමකින් ජල සැපයුම් පද්ධති 02 ක් ස්ථාපිත කර තිබුණු නමුත් ඒ සඳහා ඉදි කළ නල ළිං 04 හි ජලය ප්‍රමාණවත්ව නොතිබීමෙන් ටැංකි 04 කට හා ලිදකට ජලය එක් රැස් කර ක්ෂත්‍රය කොටස් | පැවති අඩුපාඩුකම් මග හරවමින් දැනට නිවැරදිව ක්‍රියාත්මක වේ. | ශක්‍යතා අධ්‍යයනයන් මත ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමටත් ජල සැපයුම් පද්ධතිවල පවත්නා අඩුපාඩුකම් නිවැරදි කර ඒවා සාර්ථකව ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| කර දින 07 කට වරක් බැගින් ජලය සපයනු ලැබීමෙන් ගසකට ප්‍රමාණවත් ජලය නොලැබුණු අතරපල්ලම ජාන සම්පත් මධ්‍යස්ථානයේ අක්කර 215 ක භූමි ප්‍රමාණයක පවතින පොල් වගාව මෙම ජල සැපයුම් පද්ධතියෙන් ආවරනය නොවීය. ඒ හේතුවෙන් මෙම ජල පද්ධතිවලින් අපේක්ෂිත ප්‍රතිඵල ලැබෙන බව නිරීක්ෂණය නොවීය. | | |
| (ආ) 2019 ජුලි 07 දිනැති අංක 02/2019 දරන මණ්ඩලයේ වතු කළමණාකරන චක්‍රලේඛය ප්‍රකාරව පොල් කැඩු විගස විකිණීමට කටයුතු කළ යුතු වුවද, ජාන සම්පත් මධ්‍යස්ථාන 10 හි 2021 ජනවාරි සිට නොවැම්බර් මාසය දක්වා කඩන ලද පොල් ගෙඩි 4,123,986 කින් ගෙඩි 939,933ක් හෙවත් සියයට 22 ක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් විකිණීමට කටයුතු කර නොතිබුණි. | 2022 ජනවාරි හා පෙබරවාරි මාස තුළදී 2021 වර්ෂයට අදාළ බීජ පොල් හා අලෙවි කරන ලද පොල් සියල්ල ඉවත් කර ගෙන ඇත. | පොල් කැඩූ විගස විකිණීමට කටයුතු කළ යුතුය. විකිණීම ප්‍රමාද කළ නිලධාරීන්ගේ එම දුර්වල කාර්සාධනය සම්බන්ධයෙන් විනය පියවර ගත යුතුය. |
| (ඇ) මණ්ඩලයට අයත් ජාන සම්පත් මධ්‍යස්ථාන 10 අතුරින් 2021 වර්ෂය තුළ පොත්තුකුලම මධස්ථානයේ මුර 12ක පොල් අස්වැන්නක් ලබා ගනිද්දී අනිකුත් මධ්‍යස්ථාන 09 හි ලබාගෙන තිබූ අස්වැන්න මුර 07 ක් හෝ 8 ක් පමණක් විය. නියමිත කාලයට පොල් නොකැඩීම ප්‍රශස්ත පොල් අස්වැන්නක් ලබා ගැනීම කෙරෙහි බලපානු ලබන නමුත් ඒ කෙරෙහි වගකිව යුතු පාර්ශවයන්ගේ අවධානය යොමු වී නොතිබුණි. | ඒ ඒ පර්යේෂණ මධ්‍යස්ථානයේ හෝ ජාන සම්පත් මධ්‍යස්ථානයේ තාක්ෂණික කරුණු සලකා බලමින් වාර්ෂිකව නෙලන ලද පොල් මුර ගණන තීරණය කර ඇස්තමේන්තු ගත පොල් එලදාව සකස් කර ගනී. | පොල් මුර සංඛ්‍යාව අඩුවීම පිළිබඳ පරීක්ෂණයක් කළ යුතුය. පොල් අස්වැන්න නෙලා ගැනීම පිළිබඳ නිසි උපදෙස් නිකුත් කළ යුතුය. |
| (ඇ) පොල් පර්යේෂණ ආයතනයේ උපදෙස් පත්‍රිකා අංක 2 හි සඳහන් තවාන් පාලනය හා පොල් පැළ තෝරා ගැනීමේ උපදෙස් අනුව ගෙඩි සිටුවා මාස 05 කින් පැළ නොවන හා ප්‍රමාද වී පැළවෙන ගෙඩි ඉවත් කළ යුතු අතර එහි ප්‍රතිශතය සියයට 18 ක් වන බවට සඳහන් කර තිබුණි. එසේ වුවද, පල්ලම හා අඹකැලේ ජාන සම්පත් මධ්‍යස්ථානවල 2020 යල කන්නයේ හා 2021 මහ කන්නයේ තවාන් කළ වර්ග කිහිපයක දෙමුහුන් බීජ 99,670 කින් මාස 05 කදී අසාර්ථක ලෙස ඉවත් කළ පැළ ප්‍රමාණය 28,098 ක් හෙවත් සියයට 28 ක් තරම් ඉහළ ප්‍රමාණයක් වූ අතර මේ කෙරෙහි වගකිව යුතු පාර්ශවයන්ගේ අවධානය යොමු වී නොතිබුණි. | පොල් පර්යේෂණ ආයතනයේ ප්‍රවේණි හා ශාක අභිජනන අංශයේ නිර්දේශයට අනුව ගුණාත්මක තත්ත්වයේ උසස් පොල් පැල ලෙස තේරීමට ලක් කර සහතික කිරීමෙන් පසුව අලෙවි කරනු ලබන්නේ සියයට 70 ක පමණ පොල් පැළ ප්‍රමාණයකි. | සියයට 18 ක ඉඩදී ඇති ප්‍රතිශතයට වඩා ඉවත් කළ බවට සඳහන් ප්‍රතිශතය සියයට 10 කින් ඉහළ යාමට හේතුව සොයාබලා අවශ්‍ය ප්‍රතිකර්ම යෙදිය යුතුයි. |

| | | |
|---|---|---|
| (ඉ) මණ්ඩලය විසින් 2015 ත් 2021 ත් අතර කාලය තුළ ආරම්භ කරන ලද දීර්ඝ කාලීන පර්යේෂණ 08 ක් අවසන් කරනු ලබන වර්ෂයක් සඳහන් කර නොතිබුණු අතර තවත් පර්යේෂණ ව්‍යාපෘති 08 ක් වර්ෂ 9 ත් 21 ත් අතර කාලයක් තිස්සේ ක්‍රියාත්මක වෙමින් පැවතුණි. එසේම 2021 වර්ෂයේ අවසන් කිරීමට සැලසුම් කර 2016 ත් 2019 ත් අතර කාලය තුළ ආරම්භ කළ තවත් පර්යේෂණ 21ක් අවසන් කිරීමට නොහැකි වී තිබුණි. ඒ හේතුවෙන් පර්යේෂණය ආරම්භ කළ නිලධාරියාටම එය අවසන් කිරීමට ඉඩකඩ නොලැබීම, කාලයත් සමඟ තාක්ෂණයේ සිදු වන වෙනස්වීම යනාදී කරුණු අනුව පර්යේෂණයේ ප්‍රතිඵල, මණ්ඩලයේ අරමුණු සඳහා යොදවා ගැනීම කෙරෙහි බලපානු ලබන බවට නිරීක්ෂණය විය. | බහු වාර්ෂික බෝගයක් වන පොල් සම්බන්ධ බොහෝ පර්යේෂණ සඳහා දීර්ඝ කාලයක් ගතවීම සාමාන්‍ය දෙයකි. අවසන් කරනු ලබන වර්ෂයක් සඳහන් කර නොමැති පර්යේෂණ යාවත්කාලීන කර එම පර්යේෂණ අවසන් කරන වර්ෂය 2023 වසරේ ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කරනු ලැබේ. මේ සඳහා අවශ්‍ය අභ්‍යන්තර පර්යේෂණ කමිටු ඇගයීම් 2022 වසරේ අගෝස්තු හා සැප්තැම්බර් මාස වලදී සිදුකිරීමට සැලසුම් කර ඇත. | දීර්ඝ කාලයක් ගතවී ඇති පර්යේෂණ ව්‍යාපෘතීන් පිළිබඳව ඇගයීම් කර ප්‍රතිඵලදායී ආකාරයට ඒවා අවසන් කොට ක්ෂේත්‍රයේ වැඩි දියුණුව සඳහා යොදවාගත යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල තොරතුරු අනුව 391 ක් වූ අනුමත කාර්ය මණ්ඩලයෙන් 115 ක් පුරප්පාඩු වී පැවති අතර එය අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 29 ක් විය. එසේම මණ්ඩලයේ පර්යේෂණ අංශ 9 ක අංශ ප්‍රධානී, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ඇතුළුව අනුමත පර්යේෂණ නිලධාරීන් 56 කින් 21 ක් පුරප්පාඩු වී පැවති අතර එය අනුමත සංඛ්‍යා වෙන්සියයට 37 ක් විය.මෙම තත්ත්වය ආයතනය පිහිටුවීමේ අරමුණ නිසි පරිදි ඉටු නොවීම කෙරෙහි බලපානු ලබන බවට නිරීක්ෂණය කෙරේ. | ජ්‍යෙෂ්ඨ මට්ටමේ අභ්‍යන්තරික බඳවා ගැනීම් සඳහා මූලික සුදුසුකම් සම්පූර්ණ කරන ලද අභ්‍යන්තර නිලධාරීන් නොමැති වීමත්, සුදුසුකම් සහිත අයදුම්කරුවන් නොමැති වීමත් හේතු වූ අතර ජාතික අයවැය චක්‍රලේඛයෙන් කල්දමා ඇති බඳවා ගැනීම් සඳහා අවසර ලබාදුන් විගස පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කෙරේ. | පුරප්පාඩු පිරවීමට හෝ සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |